# යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට හඳුන්වා දීම.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික සැලැස්මේ සහ අප රටෙහි රාජ්‍ය තාන්ත්‍රික අත්දැකීම්,**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටක උත්තරීතර නීතිය වේ. ශ්‍රී ලංකාව ජන රජයකි. පරමාධිපත්‍ය (පාලන බලය) ජනතාව කෙරෙහි පිහිටා තිබීම ජන රජයක මූලික ගුණාංගය වන අතර රාජාණ්ඩුවක එම බලය රජුට හෝ රැජිණට පැවරී ඇත. 1978 අපගේ 2 වැනි ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික සැලසේම් සඳහන් 3 වෙනි සහ 4 වෙනි ව්‍යවස්ථා අනුව ජනතාවගේ පරමාධිපත්‍යට ඇතුළු වූ ;

I. ව්‍යවස්ථාදායක බලය (නීති සම්පාදනය කිරීමේ බලය) ජනතාව විසින් තෝරා පත් කරගනු ලබන පාර්ලිමේන්තුව මගින්ද ,
II. විධායක බලය (ආණ්ඩුව ක්‍රියාත්මක කිරීමේ බලය) ජනතාව විසින් තෝරාපත් කර ගනු ලබන ජනාධිපතිවරයා මගින්ද ,
III. අධිකරණ බලය (ආරවුල්, අයිතිවාසිකම්, වගකීම් යන ආදිය විනිශ්චය කිරීමේ බලය) නීතිය යටතේ පිහිටුවන ලද අධිකරණ මගින්ද,

ජනතාව විසින් ක්‍රියාත්මකව භුක්ති විඳිනු ලැබේ. මෙසේ බලවත් හැඟීම් පහළ කරන , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උතුම් සංකල්පය මත පිහිටුවා, අපගේ අත්දැකීම් වෙත යොමු වී, සත්‍ය ලෙස ජනතාව විසින් මෙම බලය ක්‍රියාත්මක කර භුක්ති විඳ තිබේ දැයි, නැතහොත් එම බලය ක්‍රියාත්මක වීමෙන් ජනතාවට එදිනෙදා ජීවිතයේ සැලකිය යුතු යහපතක් සිදු වී තිබේදැයි, සිතන විට ලැබෙන පිළිතුර, නැත යන්නය. යථාර්ථය නම් විශේෂයෙන්ම විධායකය විසින් මෙම බලය අයථා ලෙස භාවිතා කර ඇති බවත්, ඒ සටනට නාස්තිය, දූෂණය හා ඥාතීන් සහ ගෝල බාලයින්ට සංග්‍රහ කිරීම බලවත් ලෙස සිදු වී ඇති බවත්ය. සියළු සෑම ක්‍රමවේදයකින්ම සූරාගනු ලැබූ බදු මුදලින් සහ මතු පරම්පරාවන් ණය ගැති භාවයට පත් කරන දේශීය සහ විදේශීය ණය මගින්, මෙම බලවත් ලෙස සිදුවන අයථා පාලනයට සම්පත් සලසන ජනතාව රවටනු ලැබූ අසරණ ගොදුරක් බවට පත් වී ඇත.

බලය මෙහෙය වූ පුද්ගලයින්ගේ අයථා පාලනය මෙම පහත් තත්වයට ඇද වැටීමට බෙහෙවින් හේතු වී තිබේ. එහෙයින් වරද මේ පුද්ගලයින් තුල මිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩුවක් නොවේ යැයි තර්කයක් ගොඩනැගෙනු ඇත. ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් බැඳීමක් නැතුව, දස රාජ ධර්මය සහ පාරම්පරිකව ගොඩනැගුනු සිරිත් විරිත් අනුගමනය කළ රජවරු ජනතාවගේ යහපත කෙරෙහි උපරිමයෙන් කැප වූ බව ඉතිහාසයෙන් හෙළිදරවු වේ. එහෙත් නූතන රජයට මෙවැනි සාරධර්ම අනුව පාලකයින් ක්‍රියාකරනු ඇතැයි විශ්වාස කිරීම ප්‍රඥාවන්ත පිළිවෙතක් නොවේ. බලය මෙහෙයවන පුද්ගලයින් ප්‍රතිඥා දෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ක්‍රියා කිරීමටය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පුළුල් විධි විධාන සහ මුක්තිය තමන්ගේ වාසියට උපයෝගී කර ගැනීමට සට කපටි පුද්ගලයින් යොමුවනු ඇත. එහෙයින් ජනතාවගේ සුබ සාධනය සහ යහ පාලනය සාක්ෂාත් කර ගැනීමටත්, දැනට ඇද වැටෙන ප්‍රපාතයට යොමුවීමේ අවකාශය අවම කර ගැනීමටත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වැදගත් විධි විධාන නිශ්චිත සීමා කිරීම් වලට යටත්ව කෙටුම්පත් කිරීම අත්‍යවශ්‍ය වේ.

වර්ෂ 150 ක් බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් වූ අප රටෙහි ආණ්ඩුක්‍රමය ව්‍යවස්ථාමය ස්වයං පාලනයකට යොමුවීම ක්‍රමයෙන් සිදුවිය. ආධිපත්‍ය බ්‍රිතාන්‍ය රාජාණ්ඩුව කෙරෙහි පිහිටා තිබූ නමුත් බ්‍රිතාන්‍ය ව්‍යවස්ථාවේ කාලාන්තරයක් මුළුල්ලේ පිළිගෙන තිබූ සම්ප්‍රදායන් අනුව එම බලය පාලනය ආයතන මගින් රාජාණ්ඩුව නමින් මෙරට ක්‍රියාත්මක විය. එම නිසා, යටත් විජිතයක් වූවත් යම් පමණකින් යථා පාලනයක් සහ පුද්ගලික අයිතිවාසිකම් සුරක්ෂණයක් සිදු

විය. 1948 දී ඩොමීනියන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ස්වයං පාලනය කරා යථා පරිදි සංක්‍රමණයටත් සිදු වූ අතර පෙර සඳහන් සම්ප්‍රදායන් අඛණ්ඩව අනුගමනය කරන ලදී.

1972 පළමු ජනරජ ව්‍යවස්ථාව අතීත සංක්‍රමණයෙන් සම්පූර්ණයෙන්ම බිඳී ජනතාවගේ පරමාධිපත්‍යයෙන්ම උත්ගත වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් බවට පත්විය. මෙම ව්‍යවස්ථාව යටතේ ජනාධිපති තනතුර, රජයේ ප්‍රධානියා, විධායකයේ ප්‍රධානියා සහ සන්නද්ධ සේනාවන්හී සේනාධිනායකයා වශයෙන්, ස්ථාපනය වූවත්, ජනාධිපති අගමැතිගේ නම් කිරීම මත පමණක් පත්විය. (1972 ව්‍යවස්ථාව 25 වැනි වගන්තිය) ජනාධිපති තනතුර අගමැතිට සම්පූර්ණයෙන්ම යටත් වූ නිලයක් බවට පත්විය. පාර්ලිමේන්තුව වෙනුවට පැවති ජාතික රාජ්‍ය සභාව, රාජ්‍ය බලයේ උත්තරීතර ආයතනය බවට පත්විය. (5 වන වගන්තිය) අගමැති සහ ඇමතිවරු අති බලවත් වූ අතර සෙසු ආයතන ඔවුන්ට යටවිය. නිදසුනක් වශයෙන් ගතහොත් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පැවති ශ්‍රේෂ්ඨාධිකරණයේ මංගල රැස්වීමේ මුලසුන දැරුවේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්ය. අධිකරණ ඇමති ශ්‍රේෂ්ඨාධිකරණ ගොඩනැගිල්ලේ තම කාර්යාලය පැවැත්වූ අතර, එක් වතාවක් රජයට විරුද්ධව තීන්දුවක් දෙනු ලැබේ යැයි සැකයක් ඇති වූ විට විනිශ්චය මැදිරියේ දොර වසා විනිශ්චයකරුවන් මැදිරියට පැමිණීම අවහිර කරන ලදි. ජාතික රාජ්‍ය සභාව (පාර්ලිමේන්තුව) විසින් ධූර කාලය අවුරුදු 05 සිට 07 දක්වා දිගු කරන ලදි. මෙය "සත් අවුරුදු සාපයක් ලෙස" දැඩි විවේචනයට ලක්කල විපක්ෂය 1977 දී වාර්තා ගත 5/6 ක බලයක් ලබා ගනිමින් පාර්ලිමේන්තුවේ බහුතර බලය ලබා ගත්හ.

පාලනය සිය අතට ගත් ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා නොපමාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පෙරළියක් සිදු කළේය. බලයට පත්වී මාස 03 ක් ඇතුළත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කිරිමෙන් ද, පසුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නීතිගත කිරිමෙන්ද ඔහු විධායක ජනාධිපති තනතුර බලවත්ම ආයතනය බවට පත් කළේය. අගමැති ද සීමා රහිතව ඇමතිවරුන් හා උප ඇමතිවරුන් පත්කිරිමට ද ඉවත් කිරිමටද, කිසියම් විෂයක් හෝ ඇමති තනතුරක් තමන් වෙත පවරා ගැනීමට ද පූර්ණ බලයක් ජනාධිපතිට හිමි විය. නව ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් ද අනුප්‍රාප්තිකයන් ද ඔහුගේ තනි අභිමතය අනුව පත් කරන ලදි. තමන්ගේ අභිමතය අනුව කිසියම් හෝ පුද්ගලයෙක් අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත්කිරීමට ජනාධිපතිට බලය හිමි වූ අතර අමාත්‍යාංශයක දෙපාර්තමේන්තුවක මෙසේ පත් කරන ලද ලේකම් හෝ ප්‍රධානියා යටතේ පාලනය විය. රාජ්‍ය සේවය සහ පොලිසිය ජනාධිපති ප්‍රධානත්වය දැරූ කැබිනට් මණ්ඩලය යටතේ පාලනය විය. ජනාධිපති සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකවරයා වූ අතර, මහජන ආරක්‍ෂක පනත යටතේ හදිසි අවස්ථාවක් ප්‍රකාශනය කිරිමට නීතිය අභිබවා යන නියෝග කිරිමට ද බලය ලැබුනි. මහ මැතිවරණයක් පවත්වා අවුරුද්දක් ගත වීමෙන් පසු කිසියම් හෝ අවස්ථාවක පාර්ලිමේන්තුව විසුරුවා හැරිමට බලය ජනාධිපතිවරයාට හිමි විය. ජේ.ආර්ගේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරිමට ජනතාවට පැහැදිලි පොරොන්දු දුන් ඔහුගේ සමහර අනුප්‍රාප්තිකයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් මෙම බලය තවදුරටත් තහවුරු කරමින් ඒකාධිපති තත්වයකට පත්වීමේ නැඹුරු වීමක් දැන් ගම්‍ය වේ. ඒ අනිටු විපාකයන්ට ගොදුරු වන්නේ එම ප්‍රවණතාවට ආවඩන ජනතාව පමණක් නොවේ.

1972 දී වූ එක් අන්තයකටද, 1978 දී වෙනත් අන්තයකට බලය සංක්‍රමණය වූ බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විග්‍රහයකින් ප්‍රකට වේ. 1972 දී සර්ව බලැතැ අගමැති, සහ ජාතික රාජ්‍ය සභාවත් බිහිවූ අතර, 1978 දී සර්ව බලැති විධායක ජනාධිපති තනතුරක් නිර්මාණය විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමෙන් යථා පාලනයක් සහ එමගින් ජනතාවගේ සුභ සාධනය සැළසෙන අයුරින් පාලන බලය මෙහෙයවන ආයතන අතර සමතාවයක් සහ එක් ආයතනයක් විසින් බලය අයථා ලෙස යෙදවීම වැළැක්වීමට අනෙක්

ආයතනයන්ට බලය පැවරීමේ ක්‍රමවේදයක් ඇතුළු කරමින් තුලනය වූ මැදුම් පිළිවෙතකට යොමු නොවීම රටේ අභේතුවකි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යටතේ රටක් පාලනය විය යුතුය යන විශ්වාසය සහ ඒ මත ගොඩනැගුණු න්‍යාය 18 වන සියවසේ යුරෝපයේ වර්ධනය වූයේ එක් අතකින් දේව බලයකට හිමිකම් පෑ අත්තනෝමතික දුෂ්ට රාජාණ්ඩු යටතේ වූ කටුක අත්දැකීම් සහ අන් අතින් කලක සිට ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂණය කිරීම සඳහා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව රාජාණ්ඩුව කෙරෙහි යෙදවූ සීමා කිරීම් යටතේ වූ සුභවාදී තත්වය පසුබිම් කර ගෙනය. 1748 මොන්ටෙස්ක් නැමති සුප්‍රසිද්ධ ප්‍රංශ ජාතික නීතිවේදියා පාලන බලය ආයතන තුනක් අතර, වෙන් කිරීමේ නූතන න්‍යාය මුලින්ම තම කෘතියකින් ඉදිරිපත් කළේය. එක් ආයතනයක් සීමා කිරීම් ඔස්සේ අන් ආයතන විසින් තුලනය වීමේ ක්‍රමවේදය මෙම න්‍යායට ඇතුළත් විය.

ප්‍රංශ විප්ලවයද ඇමරිකාව නිදහස් කර ගැනීමේ යුද්ධ සහ සිවිල් යුද්ධය ද එකී ජනතා මෙහෙයුම් තුළින් දෙරටම ජනිතවූ ලොව මුල්ම ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවද ජනතාව කේන්ද්‍ර කොට ගත් මෙම ලිබරල් චින්තනයේ ප්‍රතිඵල වේ. කාලයාගේ ඇවෑමෙන් නොබිඳී පැවති ඇමරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ එයට සිදු කරන ලද මුල් සංශෝධන 14 එරට යහ පාලනයට ශක්තිමත් අඩිතාලමක් වී ඇත. බලය වෙන් කිරීම වචනයෙන් පමණක් වූ විශේෂයෙන් විධායකය කෙරෙහි යොදන සීමා කෙරෙහි රැවටිලි සහිතවූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මුවාවෙන් ඒකාධිපතීන් මර්ධනකාරී පාලන පවත්වාගෙන යනු ඇත. සූක්ෂම සහ වංචනික ලෙස බලය එක් රැස් කර ගෙන ජනතාවගේ අගතියට බලය අයථා ලෙස යෙදවීමේ එම ප්‍රපාතයට අප රට සම්පූර්ණයෙන්ම කිඳා බැස්සීම වැළැක්වීමට අවශ්‍ය සුරක්ෂණ සහ ක්‍රමවේදයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළු කිරීම මතු පරම්පරාව වෙනුවෙන් ගත යුතු ජාතික මෙහෙවරක් වේ.

**යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන -**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නොයෙක් කොටස් කරා විහිදී ඇතත්, එහි ක්‍රියාකාරීත්වය ප්‍රත්‍යක්ෂ කර ගැනීම සඳහා යෝජිත පහත සඳහන් වන ප්‍රධාන කාණ්ඩ 03 කට වෙන් කර සළකා බැලීම සුදුසු වේ.

(අ) ජනාධිපති ආයතනය සහ විධායකයෙහි ප්‍රතිසංස්කරණය

(ආ) මැතිවරණ ක්‍රමයේ ප්‍රතිසංස්කරණ සහ පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීම.

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් පත් කිරීම පිළිබඳව පෙර පැවති අවහිරතා ඉවත් කර අධිකරණයේ, රාජ්‍ය සේවයේ, පොලිස් සේවයේ, මැතිවරණ කොමිසම් සභාව, අල්ලස් හෝ දූෂණ කොමිසම් සභාව යන ආයතනයන් හී ස්වාධීනත්වය සුරක්ෂිත කිරීම සඳහා 17 වෙනි සංශෝධනය නැවත නීති ගත කිරීම.

(අ) ජනාධිපති ආයතනය සහ විධායකයෙහි ප්‍රතිසංස්කරණය

**මේ සම්බන්ධයෙන් මතුවෙන ප්‍රධාන ප්‍රශ්න සහ ඒ සම්බන්ධයෙන් යොමු විය යුතු ආකාරය මෙසේ**

1. ශ්‍රී ලංකාව ජනරජයක් වන නිසා රජයේ සහ විධායකයේ ප්‍රධානියා ලෙසද, සන්නද්ධ සේනාවන්හි සේනාධිනායකයා ලෙස ද කාර්යය ඉටු කිරීම සඳහා ජනාධිපති ධූරය අවශ්‍යය. රාජ්‍ය නායක තත්වයත් ආණ්ඩුවේ බලය ක්‍රියාත්මක කිරීමත් අතර, වෙන්වීමක් සිදු විය යුතුය. එහෙයින් රටේ එකමුතු භාවය සහ ආරක්ෂාව සාක්ෂාත් කරන

ජාතික නායක මට්ටමින් ජනාධිපති තනතුර පවත්වන අතර, ආණ්ඩුව මෙහෙයවීම අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයට පැවරීමේ ක්‍රමවේදයක් සැලසීම අවශ්‍ය වේ.

2. **ජනාධිපති කෙසේ පත්විය යුතු ද ?** මේ සඳහා ඇති විකල්ප පහත සඳහන් වේ.

   I. **1972 ව්‍යවස්ථාව යටතේ මෙන් අගමැති විසින් පත්කරනු ලැබීම.**
   එවිට ජනාධිපති අගමැතිට යටත්වූ නිශ්ඵල තනතුරක් වනු ඇත.

   II. **පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වරුන් විසින් පත් කරනු ලැබීම.**
   එවිට ජනාධිපති, ඇමතිවරුන්ට සහ මන්ත්‍රීවරුන් ද ණයගැති පාර්ලිමේන්තුවේ පක්ෂ භේදයේ ප්‍රතිරූපයක් වනු ඇත.

   III. **ජනතාව විසින් පත් කරනු ලැබීම.**
   පහත සඳහන් හේතු දෙක නිසා (111) විකල්පය සුදුසු වේ. ඍජුවම ලැබෙන ජනවරම නිසා ජනාධිපතිට තමන්වෙත පැවරෙන කටයුතු අර්ථ සම්පන්න ලෙස ඉටු කිරිමට අවශ්‍ය ශක්තියක් ලැබීම පළමු හේතුව වේ.

   "ජනාධිපතිවරයා ජනතාව විසින් තෝරාපත් කර ගත යුත්තේය. ජනාධිපතිවරයා සය අවුරුදු කාලයක් ධූරය දරන්නේය" යනුවෙන් 30(2) ව්‍යවස්ථාවේ සඳහන්ව ඇත. 83(ආ) ව්‍යවස්ථාව අනුව පෙර කී 30 (2) ව්‍යවස්ථාවට අනුකූල කිසියම් සංශෝධනයක් පාර්ලිමේන්තුවේ 2/3 ක අනුමැතියට අමතරව ජනමත විචාරණයකින් ද සම්මත විය යුතුය. කල්ගත වෙන වියදම්දායී එවැනි ක්‍රියාදාමයක් මෙම අවස්ථාවට සුදුසු නැත. එහෙයින් ජනාධිපතිගේ බලය කෙරෙහි සීමා කිරිම් යොදවා ජනතාව විසින් ජනාධිපති තෝරාපත් කර ගැනීමේ ප්‍රජාතන්ත්‍රවාදී විකල්පය සුදුසු වේ.

3. **ජනාධිපතිගේ බලය පිළිබඳ ප්‍රශ්නය.**

   දැනට කිසියම් පාලනයකට හෝ සීමා කිරිමටක යටත් නොවූ, නොයෙක් අංශවලට විහිදෙන විශාල බලයක් ජනාධිපති සතු වේ. ඔහුට විරුද්ධව ගත හැකි එකම ක්‍රියාමාර්ගය දෝෂාභියෝගයක් පමණක්ය. එවැන්නක් පාර්ලිමේන්තුවේ දී දෙවතාවක් 2/3 ක ඡන්දයෙන් අනුමත විය යුතු අතර, එයට පදනම් වන චෝදනාවන් ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවැත්විය යුතු පරීක්ෂණයකින් තහවුරු විය යුතුය. අතීතයේ එවැනි ක්‍රියාමාර්ගයකට යොමු වූ එකම අවස්ථාව ව්‍යර්ථ වූ අතර, ඒ සම්බන්ධයෙන් ක්‍රියාකාරී වූ ඇමතිවරු දෙදෙනා, එනම් ලලිත් ඇතුලත් මුදලි සහ ගාමිණී දිසානායක මහත්වරුන් පාර්ලිමේන්තුවෙන් ද ඉවත් කරනු ලැබුණි.

4. ඇමතිවරු සහ අමාත්‍යාංශ ලේකම්වරුන් පිළිබඳ ප්‍රශ්නය.
   දැනට ඇමතිවරු සහ ලේකම්වරු පත්කිරීම ඉවත් කිරිම, ජනාධිපතිගේ පූර්ණ බලයට යටත්ය.

**යෝජිත සංශෝධනයෙහි ඉහත සදහන් ප්‍රශ්න සහගත කරුණු 04 සම්බන්ධයෙන් යොමු වී ඇත්තේ මෙසේය.**

i. රජයේ ප්‍රධානියා යනාදී වශයෙන් 30 වන ව්‍යාවස්ථාවේ සදහන් වෙන ජනාධිපතිගේ තනතුර සහ තත්වය පිළිබඳව කිසිදු සංශෝධනයක් සිදු නොවේ.

ii. නව 30(4) ව්‍යවස්ථාව අනුව තනතුර භාරගැනීමෙන් පසුව ජනාධිපති දේශපාලන පක්ෂයක සාමාජිකයෙක් නොවිය යුතු අතර, නැවත ධූරයට පත්වීමට නුසුදුස්සෙක් වන්නේය. (සංශෝධනයේ දෙවැනි ජේදය) ඒ අනුව ඡන්දයෙන් තෝරාපත් කර ගැනීමෙන් පසුව ජනාධිපති පක්ෂ දේශපාලනය ඉක්මවා යන ජාතික නායකයෙක් වීමට සුදුසු පසුබිමක් සැලසේ. තමන් නැවත ඡන්දයෙන් තෝරාපත් කර ගැනීම සාක්ෂාත් කර ගැනීම සඳහා පළාත් සභා සහ පාළාත් පාලන ආයතන ඡන්දයන්හි පවා තම පක්ෂය ශක්තිමත් කර ගැනීමට ජනාධිපති ඍජුව මැදිහත්වීම තමන් ජාතික නායකයෙක් ලෙස බිහිවීමට ඇති අවකාශය අවහිර කරන අතර, එවැන්නක් මෙම සංශෝධනයේ ඉවත් වෙනු ඇත.

iii. ජනාධිපතිගේ සහ පාර්ලිමේන්තුවේ ධූර කාලය එකට ගෙවී යන අතර, ඡන්ද දෙකම එකට පැවැත්වීය යුතුය. මේ නිසා මැතිවරණ සඳහා වියදම අවම වන අතර, මැතිවරණ විටින් විට පැවැත්වීම නිසා දැනට උග්‍රවෙමින් පවතින සම්පත් සහ කාලය නාස්තිවීම සහ මැතිවරණ බහුලත්වය තුළින් රට භාජනය වන ආයාසය, එමගින් දුරුවනු ඇත. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ සභාපතීත්වයෙන් පැවැත්වූ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව විසින් සියළු පක්ෂවල කැමැත්ත ඇතිව යෝජනා කරනු ලැබූ සරල පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය නීති ගත කිරිම ඡන්ද දෙකම එකට පැවැත්වීමට අවකාශයක් සැලසෙනු ඇත. මැතිවරණ ක්‍රමය නීති ගත කිරිම (ආ) කොට්ඨාශයට ඇතුලත් වේ. යෝජිත 31(3) ව්‍යවස්ථාව අනුව ජනාධිපතිගේ සහ පාර්ලිමේන්තුවේ ධූරකාලය සමාන්තර වූ සය අවුරුද්දක් වනු ඇත. (සංශෝධනය 3 වැනි ජේදය) සංශෝධිත 70(1) ව්‍යවස්ථාව අනුව ජනාධිපති විසින් කාලසීමාව අවසන් වීමට පෙර අවස්ථාවක පාර්ලිමේන්තුව විසුරුවා හැරිමට නොහැකි වනු ඇත. (සංශෝධනය 13 වන ජේදය) කාල සීමාවක් ඉක්මව යෑමට පෙර ඡන්ද පැවැත්වීමට බලයක් ජනාධිපතිට පැවරී තිබෙන නමුත් එමගින් නැවත ඡන්දයට ඉදිරිපත්වීමට අවකාශයක් නැතිව තමන්ගේ ධූර කාලය අවසන්වීම නිසා එකී අභිමතය ජනාධිපති විසින් අයථා ලෙස භාවිතා කිරිම් උග්‍ර වී ආණ්ඩුව පවත්වාගෙන යෑම සම්පූර්ණයෙන්ම අවහිර වූ අවස්ථාවකදී නියමිත කාලය ගෙවී යාමට පෙර ඡන්ද දෙකම පැවැත්වීමේ අවශේෂ බලයක් ජනාධිපති සතුවේ.

5. අගමැති සහ ඇමතිවරුන් සහ නියෝජ්‍ය ඇමතිවරුන් පත්කිරිමට සහ ඉවත් කිරිමට කිසියම් හෝ අමාත්‍යාංශයක් හෝ විෂයක් තමන් වෙත පවරා ගැනීමට ද ජනාධිපති වෙත අසීමිත බලයක් පවරන වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 සිට 50 දක්වා වූ ව්‍යවස්ථා ඉවත් කරනු ලැබේ. (සංශෝධනයේ 8 වැනි ජේදය) යෝජිත 44 සිට 47 දක්වා වන ව්‍යවස්ථාවන්හි ඇතුලත් වැදගත් කරුණු මෙසේය.

I. ඇමතිවරුන් සංඛ්‍යාව 25 කට සීමා වන අතර, පත්කරනු ලබන ඇමතිවරුන්ගේ සංඛ්‍යාවට සාපේක්ෂව නියෝජ්‍ය ඇමතිවරුන්ගේ සංඛ්‍යාවද සීමා වනු ඇත. (44(1) ව්‍යවස්ථාව)

II. පාර්ලිමේන්තුවේ විශ්වාසය උපරිම පමණකින් ලබා ඇති මන්ත්‍රීවරයා අගමැති වශයෙන් පත්විය යුතුය. ජනාධිපතිගේ මතය අනුව මෙම පත්කිරීම සිදු කිරිමට බලයක් පවරන 44(3) ව්‍යවස්ථාව ඉවත් කරනු ලැබේ.

III. ඇමතිවරු පත්කිරිමේදී සහ විෂයන් පැවරීමේදී ජනාධිපති විසින් අනුගමනය කළ යුතු අදහස් විමසීමේ පිළිවෙත 44(1)(ආ) ව්‍යවස්ථාවේ සදහන් වේ.

IV. මහමැතිවරණයකින් පසුව අගමැති සහ ඇමතිවරුන් පත්වූ විට ඔවුන් නැවත මහමැතිවරණයක් අවසන් වන තෙක් තනතුරු දරනු ඇත. කිසියම් අවස්ථාවකදී තම අභිමතය අනුව ඉවත් කිරිමට ජනාධිපතිට දැන් පවතින අන්දමේ බලයක් සතු නොවේ. අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවට වගකිවයුතු අතර, පාර්ලිමේන්තුව ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය හෝ විසර්ජන පනත ප්‍රතික්ෂේප කළ හොත් නැතිනම් ආණ්ඩු කෙරෙහි විශ්වාස භංග යෝජනාවක් සම්මත කළ හොත්, අමාත්‍ය මණ්ඩලය විසිරි යනු ඇත. එවැනි අවස්ථාවකදී පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිට දැන් පැවරී ඇති බලය ඉවත් කර තිබේ. පෙර සදහන් අදහස් විමසීමේ පිළිවෙත අනුගමනය කරමින් ජනාධිපති විසින් නව අගමැති වරයෙක් සහ ඇමතිවරුන් එවිට පත් කළ යුතුවේ. (යෝජිත 47 ව්‍යවස්ථාව)

V. ජනාධිපති සන්නද්ධ හමුදාවන් හී විෂයට සීමා වූ ආරක්ෂක ඇමති වනු ඇත. ජාතික සමගිය, සන්ධානය සහ එකමුතු බවද ආගමික සහ වාර්ගික සංහිදියාවද ප්‍රවර්ධනය කිරිම ජනාධිපති වෙත පැවරෙන කාර්යයක් වේ. මේ නව කාර්යය භාරය අනුව එකී කරුණු සම්බන්ධයෙන් සෘජුවම ජනාධිපති දැනුවත් වන අතර, අවහිරතා ඉවත් කිරිම සහ එකී අරමුණු ප්‍රවර්ධනය උදෙසා අවශ්‍ය විධානයන් ඇමතිවරු වෙත කිරීමට ජනාධිපතිට බලය පැවරී ඇත. ඇමතිවරුන් එම විධානයන් අනුව ක්‍රියාකිරීමට බැදී ඇත. (යෝජිත 44(2) ව්‍යවස්ථාව)

VI. එක් එක් ඇමතිවරයෙකුගේ වගකීම සහ ක්‍රියාකාරීත්වය ඇගයීමක් වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සිදු නොවේ. මෙම අඩු ලුහුඬු කම් සම්පූර්ණවීම උදෙසා විධි විධාන කිහිපයක්ම යෝජිත 45 සහ 46 ව්‍යවස්ථාවන්හී ඇතුළත් වේ. 1933 සිට 1947 දක්වා ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ සාර්ථකව ක්‍රියාත්මක වූ විධායක කාරක සභා ක්‍රමය ස්ථාපනය වනු ඇත. පාර්ලිමේන්තු මන්ත්‍රීන් 5 දෙනෙකුගෙන් සහ පළාත් සභාවකින් එක් නියෝජිතයෙක් බැගින් සාමාජිකයන් 14 දෙනෙකුගෙන් සමන්විත විධායක සභාවක් අමාත්‍යාංශයක් සදහා පත්වෙනු ඇත. එමගින් අමාත්‍යාංශ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සහ පළාත් සභා වලින් දායකත්වයක් ලැබෙනු ඇත. පළාත් සභා සහ මධ්‍යම රජයේ විෂයන් අතර, සම්බන්ධතාවයක් ඇති නිසා විධායක කාරක සභා තුළින් ජනතාවට උපරිම සේවයක් සිදුවෙන සහයෝගිතා සැලසුම් දියත් වනු ඇත.

තනතුර භාර ගැනීමෙන් මාස 03 ක් ඇතුළත ඇමතිවරයෙක් විසින් තම විෂයන් සම්බන්ධව පැහැදිලි අරමුණු සහිතව ක්‍රියාකාරී සැළැස්මක් විධායක සභාවේද

සහයෝගය ඇතිව සකස් කර ජනාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එහි අරමුණු ඉටු වීම සම්බන්ධයෙන් වාර්තා කැඳවීමට ජනාධිපතිට බලයක් පැවරී ඇත. ඇමතිගේ කාර්ය සාධනය ඇගයීමකින් පසුව අගමැතිගේද අනුමැතිය සහිතව ඇමති තනතුරෙන් ඉවත් කිරිමට ද බලයක් ඇත.

VII. අමාත්‍යාංශ ලේකම්වරු පත්කිරිම සම්බන්ධයෙන් 52(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපති වෙත පැවරී ඇති පූර්ණ බලය ඉවත් කරනු ලැබේ. යෝජිත ව්‍යවස්ථාව යටතේ ලේකම්වරු පත්විය යුත්තේ අගමැතිගේ සහ අදාල ඇමතිවරයාගේ එකඟත්වය මතය. තවද එසේ පත්කළ යුත්තේ රාජ්‍ය සේවයේ නිළධාරියෙක් පමණක්ය. ඒ අනුව අමාත්‍යාංශයේ සියළු දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් පාලන බලයක් පැවරෙන ලේකම් රාජ්‍ය සේවයේ ඉහළ මට්ටමේ නිලධාරීන් අතුරින් පත්කිරිමේ 1972 පෙර පැවති, අතිශයින්ම යහපත් පිළිවෙතට නැවත පිවිසෙනු ඇත.

**(ආ) මැතිවරණ ක්‍රියාදාමයේ ප්‍රතිසංස්කරණ සහ පාර්ලිමේන්තුව ශක්තිමත් කිරිම.**

**මේ සම්බන්ධයෙන් මතුවෙන ප්‍රධාන ප්‍රශ්න පහත සදහන් වේ.**

**01.** ජනාධිපති, පාර්ලිමේන්තු , පළාත් සභා සහ පළාත් පාලන ආයතන යනුවෙන් මැතිවරණ සිව් වර්ගයක් පැවැත්වෙනු ඇත. වර්ෂ 6,5 සහ 4 වශයෙන් මෙම ආයතන සම්බන්ධයෙන් ධූර කාලයන් නියම කර තිබුන ද නියමිත කාලයට පෙර මැතිවරණ පැවැත්වීමට විධායකයට බලයක් ඇත. තමන්ගේ වාසියට මැතිවරණ දින නියම කිරිම අප රටේ විධායක බලය මෙහෙය වූ සියළු උතුමාණන් උපයෝගී කර ගත් සූක්ෂම ක්‍රියාදාමයන්ය. මැතිවරණ යාන්ත්‍රණය සහ මාධ්‍ය බොහෝ දුරට මෙහෙය වන විධායකයකට මෙය බලවත් ආයුධයක් වී ඇත. සුදුසු ලෙස වෙන් කර පවත්වන පළාත් සභා මැතිවරණ වලට පසු ජනාධිපති ඡන්දයක් ද එය අවසන්වූ විගස මහමැතිවරණයක් පැවැත්වීම විධායකයේ උපායමාර්ගය වී ඇත.

ප්‍රජාත්‍රන්තවාදය අඩුවෙන්ම ක්‍රියාත්මකව මැතිවරණ බහුලවම පැවත්වෙන්නේ අප රටෙහිය. 1977 ට පසු වකවානුවේ එක් පොදු දුර්ගුණයක් වන්නේ බලය හිමි කරගත් දේශපාලන පක්ෂ මුල් බැහැගත් භීෂණය පැවතුන නමුත් දිගුකල් බලයේ රැඳී සිටීමය. ඊට පෙර පැවති ආණ්ඩුක්‍රම යටතේ කාලානුරූපව පාලන බලය මෙහෙය වන දේශපාලන පක්ෂ වෙනස් විය. උද්දීප්තිමත් වූ ප්‍රජාතන්ත්‍ර පිළිවෙත දිරාපත් වූ අතර දූෂණය අවම මට්ටමින් විය.

**02.** විශාල වූ දිස්ත්‍රික්ක තුල අනුපාතය සහ මනාපය මත මන්ත්‍රීවරු තේරීපත් වීම නිසා දේශපාලන පක්ෂ අතර පමණක් නොව පක්ෂ තුලද ප්‍රචණ්ඩත්වය උග්‍ර ලෙස ඉහළ යන ප්‍රජාත්‍රන්තවාදී ක්‍රමයකට අත්‍යවශය වූ නිදහස් සහ සාධාරණ මැතිවරණ ක්‍රමයකින් හාත් පසින්ම විරුද්ධ වූ දිශාවකට අප රට අපුරුවට ඇද වැටෙමින් පවතී.

**03.** ඡන්ද පොළකින් දුරස්ව පිහිටි මාධ්‍ය ගණනය කිරීමේ ස්ථාන වලට ඡන්ද පෙට්ටි ප්‍රවාහනය කිරීමත්, කල් ගත වන ගණන් කිරීමේ ක්‍රමයත් නිසා සැක උපදවන තත්වයකට ඉඩ සැලසී ඇත.

**04.** මැතිවරණයකින් වර්ෂයක් ගත වීමෙන් පසු කිසියම් හෝ අවස්ථාවක හේතු රහිතව පාර්ලිමේන්තුව විසිරුවා හැරීමට ජනාධිපතිට පූර්ණ බලයක් ඇත. ඒ හා සමානව පාර්ලිමේන්තු මන්ත්‍රීන් කුමන හෝ සංඛ්‍යාවකට අමාත්‍ය, නියෝජ්‍ය අමාත්‍ය යනාදී ධූර ප්‍රධානය කිරීමට ජනාධිපතිට අසීමිත බලයක් ඇත. දැනට වාර්තාගත සංඛ්‍යාවක් වූ මන්ත්‍රීවරුන් 107 දෙනෙකු මෙම ධූර දරනු ලබයි. මෙම බලය මෙහෙය වන්නේ පාර්ලිමේන්තුව තමන්ට සම්පූර්ණයෙන්ම අවනත වූ ආයතනයක් බවට පත් කිරීමට ජනාධිපතිට අවකාශය ලැබී ඇත. එහෙයින් පාර්ලිමේන්තුව තුලින් ජනාධිපතිගේ බලය කිසිසේත්ම සීමා නොවූ අතර පෙර විස්තර වූ බලය වෙනස් කිරීමේ පිළිවෙත විකෘති වී ඇත.

**යෝජිත සංශෝධනයන් හී ඉහත සඳහන් ප්‍රශ්ණ සහගත කරුණු හතර කෙරෙහි යොමු වී ඇත්තේ මෙසේය.**

01. ජනාධිපති සහ පාර්ලිමේන්තුව සමාන්තර වූ නිශ්චිත සය අවුරුදු කාලයකට ධූර දරණු ඇත. ජනාධිපතිගේ ධූර කාලය එක් සය අවුරුදු කාල පරිච්ඡේදයකට සීමාවනු නිසා තමන්ට වාසි සහගත ලෙස මැතිවරණ නියම කිරීමෙහි අවකාශය සහ අවශ්‍යතාවය ගිලිහී යනු ඇත.

02. ඡන්ද දෙකම එක් දිනයක පැවත්වෙන නිසා එක ඡන්දයක ප්‍රතිඵලය අනික් ඡන්දය කෙරෙහි බලපෑමට අවකාශයක් නැත. ආයතන දෙකම එක් විට ජනවරම ලබන නිසා බල මෙහෙය වීමේ සමතුලිතතාවයක් නිර්මාණයවේ.(මෙම සංශෝධිත ව්‍යවස්ථා 30(3) සහ (4), 31(3) සහ (41) 39(3) සහ 70 (1) )

03. 62 ව්‍යවස්ථාවේ සංශෝධනයක් නොවේ. පාර්ලිමේන්තුව දැන් පවත්නා අයුරින්ම මන්ත්‍රීවරුන් 225 කින් සමන්විත වේ.

04. අමාත්‍ය දිනේෂ් ගුණවර්ධනගේ සභාපතිත්වයෙන් වූ මැතිවරණ ප්‍රතිසංස්කරණය පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවෙන් සියළු පක්ෂ වල කැමත්ත අනුව යෝජිත නව පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය යෝජිත සංශෝධනයෙන් ආසන සංඛ්‍යාව ප්‍රායෝගිකව අවශ්‍ය වූ සුළු වෙනස් කිරීමට යටත්ව නීති ගත වනු ඇත. දැනට පවත්නා අනුපාත මනාප ක්‍රමය පදනම් වෙන , 95,96,97,98,99 අ ව්‍යවස්ථා ඉවත් කරනු ලැබේ. (සංශෝධනයේ 16 වන ඡේදය). ආදේශිත ව්‍යවස්ථාවන්ගෙන් ස්ථාපනය වන මැතිවරණ ක්‍රමයේ මූලික ගුණාංග මෙසේය.

05. **(අ.)** මැතිවරණය පැවත්වෙන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර පැවති ආසන 160 තුළය. ආසනයකට එක් මන්ත්‍රීවරයෙක් බැගින් ආසනයේ වැඩිම ඡන්ද ලබා ගත් අපේක්ෂකයා කේවල ක්‍රමයට ආසනයේ මන්ත්‍රීවරයා ලෙස පත්වේ. නාම යෝජනා පිළිගත් දේශපාලන පක්ෂ තුලින් හෝ (දිස්ත්‍රික්කයටම) පිළිගත් ස්වාධීන කණ්ඩායමක් තුළින් ඉදිරිපත් විය යුතුය. (97(5) ව්‍යවස්ථාව) ඡන්ද දායකයින් ලැයිස්තු සකස් වී තිබෙන්නේ, මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශ කරනු

ලබන්නේමෙම ආසන ක්‍රමය අනුව නිසා වෙනස් කිරීමෙන් කිසිම පරිපාලනමය හෝ ප්‍රායෝගික ගැටළු උද්ගත නොවෙනු ඇත.
ඡන්දදායකයින් බහුලව ආසන වලින් දිස්ත්‍රික් අනුපාත ක්‍රමයට වැඩිපුර මන්ත්‍රීවරයෙක් පත්වීමේ අවකාශය ඇති නිසා ජන සංඛ්‍යා අනුව නියෝජනයේ විෂමතාව අවම වේ.

**(ආ)** දැනට පවත්නා දිස්ත්‍රික්ක 22 න් මන්ත්‍රීන් 50 ක අනුපාත ක්‍රමයට පවත්වනු ඇත, ඒ සඳහා ගණන් ගනු ලැබෙන්නේ දිස්ත්‍රික්කය තුළ ආසන වල පක්ෂ කණ්ඩායම් වල අපේක්ෂකයෙකු ලබාගත් ඡන්ද සංඛ්‍යාවය. ඡන්ද එකතු කිරීමේ සම්බන්ධයෙන් දැනටම 2012 අංක 22 දරණ පණත මගින් පළාත් පාලන ආයතන ඡන්ද කෙරෙහි නීති ගත වී ඇති ක්‍රමවේදය ආදේශ කර ඇත. ඒ අනුව එකතු කිරීමේදී ආයතනය ජයග්‍රහණය කළ අපේක්ෂකයාගේ සහ 5% අඩුවෙන් ඡන්ද ලබා ගත් අපේක්ෂකයන්ගේ ඡන්ද ඉවත්කරනු ලැබේ. අනුපාත ක්‍රමයට දිස්ත්‍රික්කය තුළ හිමිවන ආසන සංඛ්‍යාව මෙසේ නිගමනය වන අතර ඒ සඳහා පත්වෙන්නේ පක්ෂයේ වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබා ගෙන පරාජය වූ අපේක්ෂකයින්ය.

**(ඇ)** ජාතික ලැයිස්තු වලින් මන්ත්‍රීවරුන් 15 දෙනෙක් පත් වෙන්නේ විශේෂ කාරක සභාව යෝජනා කර තිබෙන ආකාරයටම කෙටුම්පත් වී ඇති 99 ව්‍යවස්ථාව අනුවය.

**(ඇ)** පාර්ලිමේන්තුවෙන් නව නීති සම්පාදනය වන තෙක් ඡන්ද විමසීම් දෙකම එක් දිනයක පැවත්වීම අවශ්‍ය වූ අන්තර් කාලීන විධි විධාන 99 ආ, ව්‍යවස්ථාවේ සඳහන්ය.

ඡන්දදායක ලැයිස්තු දැනටමත් සකස් වෙන්නේ ඡන්ද දායකයින් 1500 කට පමණ එක් ඡන්ද පොළක් පිහිටුවන ආකාරයටය. මෙම සංඛ්‍යාව ඡන්ද විමසීම් දෙකම එකට පැවත්වීමෙන් වැඩි නොවන අතර ඡන්ද පත්‍රිකා වර්ණ දෙකකින් මුද්‍රණය කිරීමට ද, ඡන්ද පෙට්ටි ඒ සමාන වර්ණ වලින් ආවරණය කිරීමටද විධි විධාන ඇතුලත් කර තිබේ. මනාප ක්‍රමයට ඡන්දය ලකුණු කිරීමේ අවශ්‍යතාවයක් නැති නිසා ඡන්ද දායකයාගේ කාර්යද පහසු වෙනු ඇත. පළාත් පාලන මැතිවරණයන් හී ඡන්ද පොළකදී ඡන්ද ගණන් කිරීමට යොදා ඇති විධි විධාන මෙහිදී ද ඇතුළත් කර තිබේ. ආසන මට්ටමින් තේරීම් භාර නිළධාරීන් පත්වීම නිසා ප්‍රතිඵල නිකුත් කිරීමද සුළු කාලයකින් සිදුවන ඇත.

**(ඉ)** පක්ෂයෙන් ඉවත් කිරීම යනාදී හේතූන් නිසා ඇතිවන පුරප්පාඩු පිරවීම යෝජනා වී ඇති ක්‍රමවේදය 99 අ ව්‍යවස්තාවේ නීති ගත වී ඇත.

ඒ අනුව කේවල ක්‍රමයට පත් වූ මන්ත්‍රීන් සම්බන්ධයෙන් ආසනයේ පමණක් අතුරු මැතිවරණයක් පත්වනු ඇත.

## **17 වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය නැවත නීති ගත කිරීම.**

2001.10.03 දින සියළු මන්ත්‍රීවරුන්ගේ අනුමැති ඇතිව 17 වැනි සංශෝධනය සම්මත කර ගැනීමෙන් විධායක ජනාධිපතිගේ පූර්ණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සභාව යන පාර්ලිමේන්තුව යටතේ පැවති ස්වාධීන ආයතනයක් බිහි කිරීමටත් අත්‍යවශ්‍ය සීමා කිරීම් වලින් යටත් කරන ලදී. ඒ අනුව උපරිමාධිකරණයන් හී විනිශ්චය කාරවරුන්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්, නීතිපති, පොලිස්පති,

විගණකාධිපති, පාර්ලිමේන්තුවේ මහලේකම් යනාදී නිලධාරින් ජනාධිපති විසින් පත් කළ යුත්තේ සභාවේ අනුමැතිය ඇතිවය. රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මැතිවරණ කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව, අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව යනාදී මණ්ඩල සභාවේ නිර්දේශ මත ජනාධිපති විසින් පත් විය යුතුය. එමගින් නිදහස් වූත් ස්වාධීන වූත් සේවාවන් සහ ආයතන බිහි වීමට විශාල පිටුවහලක් සැලසුනි. වර්තමාන ජනාධිපති පත්වී මාස 08 ක පමණ කෙටි කාලයක් ඇතුලත 2010.09.09 දින සම්මත වූ 18 වන සංශෝධනයෙන් නැවත වතාවක් පෙර සඳහන් පත්වීම් ජනාධිපතිගේ පූර්ණ අභිමතය අනුව පත් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකසන ලදී. බොහෝ විට මන්ත්‍රීවරුන් එකම පිරිසත් දෙ ආකාරයකින් ක්‍රියාකර ඇත. අධිකරණයෙහි රාජ්‍ය සේවයේ, පොලිසියේ සහ මැතිවරණ ක්‍රියාවලියේ පක්ෂපාතී බව සහ මෙම සේවාවන් පිළිබඳ ජනතාව තුල ඇති විශ්වාසය බිඳ වැටීම 18 වැනි සංශෝධනයේ ඍජු ප්‍රතිඵලයකි. යෝජිත සංශෝධනයේ, 5,10,11,12,15,17,18,20,21,22,23 සහ 24 ඡේද මගින් නැවත 17 වැනි සංශෝධනයේ සීමා කිරීම් නීති ගත වනු ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිල නොවන සාමාජිකයින් පත් කිරීම පිළිබඳව විධි විධාන ඇති නිශ්චිත ලෙස සකස් වීම නිසා එම ක්‍රියාවලිය කඩා කප්පල් කිරීමට අවකාශයක් සැපයුනි. යෝජිත 41හා (සංශෝධනයේ 5වැනි ඡේදයේ) ව්‍යවස්ථාවෙන් සලස්වා ඇති පරිදි සභාවේ සාමාජිකයින් 06 දෙනෙකු පාර්ලිමේන්තුව විසින් රහස් ඡන්දයෙන් පත් කරනු ලබන්නේ ජාතික මට්ටමේ විද්වත් මණ්ඩල වලින්ද, විශ්ව විද්‍යාල උපකුලපති මණ්ඩලයෙන්ද, ලංකා වාණිජ මණ්ඩලයෙන්ද, කථා නායක විසින් කැඳවනු ලබන නාම යෝජනා අතුරින්ය. එමගින් පෙර සඳහන් සේවාවන් සඳහා පත් වීම් ස්වාධීනව සිදු වීමට අවකාශය සැලසෙනු ඇත.